මගේ අංකය : ඩී14/I පෙළ පු.නි තනතුරට උසස් කිරීම
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2025.07.24

සියළුම බන්ධනාගාර අධිකාරින් හා ,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත

<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීම</u>

මෙම දෙපාර්තමේන්තුවේ පවතින I පෙළ පුනරුත්ථාපන නිලධාරි (පිරිමි හා කාන්තා) තනතුරේ පුරප්පාඩු පිරවීම පිණිස 2024.03.13 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති දැනට බන්ධනාගාර සේවයේ නියුතු II පෙළ පුනරුත්ථාපන නිලධාරින්ගේ හා නිලධාරිණියන්ගේ අයදුම්පත් කැඳවනු ලබන අතර, ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පිරවීමට අපේක්ෂා කරන I පෙළ පුනරුත්ථාපන(පිරිමි) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 03ක් වන අතර I පෙළ පුනරුත්ථාපන (කාන්තා) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 01කි.

**01. බඳවා ගැනීමේ සුදුසුකම්:**

I. II පෙළ පුනරුත්ථාපන තනතුරේ වසර 05කට වැඩි සතුටුදායක හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. II පෙළ පුනරුත්ථාපන තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව තිබීම හෝ නිදහස් කර තිබිය යුතුය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02. වැටුප් ක්‍රමය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි වැටුප් පරිමාණය රු.37,030 – 24 ×660-52870 වේ. (RS 4 -2016)

**03.බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත අංක 01 ජේදයේ සඳහන් කර ඇති බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, එහිදි ජ්‍යෙෂ්ඨත්වයට සහ කුසලතාවයට ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව උසස් කිරීමෙනි.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතින් හි ඇතුළත් පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධ නීති හා රෙගුලාසි අදාළ වේ.

නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.08.15** දිනට හෝ ඊට පෙර ආයතන ප්‍රධානියා මඟින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම 2025.08.15 දිනෙන් පසු ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව දන්වමි.අවශ්‍ය අයදුම්පත් ආකෘතිය හා ලකුණු දීමේ පටිපාටිය මීට අමුණා ඇත.

..........................................

2025.07.24

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ I පෙළ පුනරුත්තාපන නිලධාරි තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරිම අනුමත</u>**

**<u>ලකුණු දීමේ පටිපාටිය</u>**

| බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ I පෙළ පුනරුත්තාපන නිලධාරි තනතුර සඳහා උසස් කිරිම අනුමත ලකුණුදීමේ පටිපාටිය | උපරිම ලකුණු | මුළු ලකුණු |
|---|---|---|
| **01. ජ්‍යෙෂ්ඨතාවය සඳහා:**<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2019 හා 01/2019(I) සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020, 01/2020(I), 01/2020(II) පරිදි සම්මුඛ පරීක්ෂණයේ දි ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. | **50** | **50** |
| **02. කාර්ය සාධන ඇගයීම:**<br>ආසන්න වසර 05 සඳහා | | **20** |
| I. විශිෂ්ඨ | **04** | |
| II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල | **03** | |
| III. සතුටුදායක | **02** | |
| **03.කුසලතාවය සඳහා :** | | **20** |
| **I. ලබා ඇති ප්‍රශංසා සඳහා**<br>- බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන ප්‍රශංසාවකට(ලකුණු 02)<br>- බන්ධනාගාර අධිකාරි විසින් දෙනු ලබන ප්‍රශංසාවකට(ලකුණු 01) | **04** | |
| **II. ක්‍රීඩා සඳහා**<br>- රාජ්‍ය සේවා හෝ ඉහළ නියෝජනය (ලකුණු 02)<br>- දෙපාර්තමේන්තු නියෝජනය (ලකුණු 01)<br>- ආයතන නියෝජනය(ලකුණු ½)- උපරිම ලකුණු 02<br>(ලකුණු ලබාදීමේදී එක් ක්‍රීඩාවකට ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ) | **04** | |
| **III. සුභසාධන හා ආගමික කටයුතු සඳහා**<br>- සභාපති,භාණ්ඩාගාරික හෝ ලේකම් තනතුර සඳහා වසරකට(ලකුණු 01)<br>- අනෙක් තනතුරු සඳහා වසරකට(ලකුණු ½) | **04** | |
| IV. **දැරූ තනතුරු හා වගකීම්** (රාජකාරියට අදාළව ඔබ විසින් දරණ ලද තනතුරකට හා වගකීමකට ලකුණු 01) | **04** | |
| **V. පුහුණු පාඨමාලා සඳහා**<br>- ඩිප්ලෝමා හෝ ඉහළ පාඨමාලා සඳහා(වසරක් හෝ ඊට වැඩි)(ලකුණු 02)<br>- සහතික පත්‍ර පාඨමාලා සඳහා (මාස 03ක් හෝ ඊට වැඩි)(ලකුණු 01)<br>- කෙටිකාලීන පාඨමාලා සඳහා (දින 03කට වැඩි)(ලකුණු ½) | **04** | |
| **04. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන ආකාරය:** | | **10** |
| I. පුනරුත්ථාපන ක්‍රමවේදය පිළිබඳ දැනුම හා ආකල්ප | **02** | |
| II. අමතර කුසලතා හා දක්ෂතා ඉදිරිපත් කිරිම. | **02** | |
| III. දායකත්ව ලබා දී ඇති විශේෂ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් | **02** | |
| IV. භාෂාව හැසිරවීම සහ කරුණු ඉදිරිපත් කිරිම. | **02** | |
| V. පෞරුෂත්වය | **02** | |
| මුළු ලකුණු | | **100** |
| සැ.යු :<br>**ඉහත 03 සඳහා ලකුණු දෙනු ලබන්නේ වර්තමාන තනතුරට පත් වූ පසු ලබා ගන්නා සහතික පත්‍ර වෙනුවෙන් පමණි.** | | |

2025.07.24

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

## I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට උසස් කිරීම සලකා බැලීම සඳහා අයදුම්පත

01. නිලධාරියාගේ නම :

02. උපන් දිනය :

03. තනතුර :

04. සේවා කාලය ( 2024.03.13 දිනට):

05. දැනට දරන තනතුරට පත් වූ දිනය :

06. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ හෝ නිදහස් කළ දිනය :

07. විසඳීමට විනය පරීක්ෂණ ඇතිද යන වග තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

08. ඔබට විරුද්ධව යම් මූලික විමර්ශනයක් ආරම්භ කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර :

09. 2024.03.13 දිනට ලබා ගෙන ඇති වැටුප් වර්ධක ගණන හා විනයානුකූල දඬුවම් ලබා ඇත්නම් ඒ පිලිබඳ විස්තර :

10. දැනට දරණ තනතුරට පත්වීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨත්වයෙන් පහත හෙලා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති කිසිවක් වැරදි හෝ අසත්‍ය බව සනාථ වුවහොත් උසස් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බවත්, උසස් කරනු ලැබීමෙන් පසුව හෙලිවුවහොත් මාගේ පත්වීම අවලංගු වන බවත් මම දනිමි.

දිනට :..........................

...............................................

අයදුම්කරුගේ අත්සන

බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය

II පෙළ පුනරුත්ථාපන නිලධාරි..................................විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ පෙරාතුව,ඔහු සම්බන්ධව ලබා දී ඇති විනය දඬුවම් හෝ විසඳීමට විනය පරීක්ෂණ ඇති/නැති බවත්,(විනය පරීක්ෂණ ඇතිනම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුය) II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරෙහි උපයාගෙන ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව .............ක් බවත්,එම කාලය තුල නිලධාරියාගේ වැඩ,හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායක බවත්,I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට උසස් කිරීමට සෑම සුදුසුකමක්ම ඔහු විසින් ලබාගෙන ඇති බවත්,සහතික කර උසස් කිරීම/නොකිරීම නිර්දේශ කරමි.

.......................................

දිනය :

බන්ධනාගාර අධිකාරි